**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වියදම් කළමනාකරණය**

---

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------------- | ---------- |
| පුනරාවර්තන වැය විෂයක් සඳහ තිබූ රු.100,000 ක ශුද්ධ ප්‍රතිඃ ඉතිරිවී තිබුණි. | දෙපාර්තමේන්තු පුස්තකාලය සඳහා රීඩර්ස් සඟරාව මිලදී ගැනීමට මෙම ප්‍රතිපාදන වෙන් කර කොවිඩ් 19 හේතුවෙන් එම මිලදී ගැනීම් සඳහ කටයුතු කිරීමට අතපසු වූ බැවින් එම ද උපයෝජනය නොවීය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාර සැලකිල්ලෙන් හා සකසුරුවම් අවබෝධයෙන් යුක්තව වැය ද සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු ෙ |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------------- | ---------- |
| (අ) බැඳීම් හා බැරකම් පිළිබඳ ප් බැරකම් ලෙස ඇතුලත් රු.14,790 ක බැරකම් 2021 නිරවුල් කර තිබුණි. | 230-1-1-0-1402 - බැරකම් upload කලයුතු දින සවස මෙම බැරකම ඇතුලත් කරමින් විදුලි බලය ඇණ හිටීම හේතුවෙන් මෙම upload කර ගැනීමට නොහැකි වූ අතර ඉ එවැනි අඩුපාඩු සිදු නොවීමට අවශ්‍ය කටයුතු ස ඇත.<br>230-1-1-0-1409 - රට තුල පැවති වසංගත තත 2020 දෙසැම්බර් මාසය තුල කඩින් කඩ කටයුතු සඳහා සේවකයින් කැඳවනු ලැබූ අ මාසයට අදාළ ඉන්වොයිස් පත්‍රය 2021.01.01 වෙත ලැබී තිබුණි. සම්පූර්ණ මාසය සඳහාම ලබා නොගත් බැවින් මාසයට අදාළ මුදල කළ නොහැකි වීම සහ දෙපාර්තමේන්තුවේ නි කඩින් කඩ සේවයට කැඳවීම නිසා එම මුද බැරකම් සඳහා ඇතුලත් කිරීමට නොහැකි වී ඇ ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට අවශ්‍ය සිදු කරනු ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක දරන රාජ්‍ය මුදල් චක්‍ර මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන ෙ වැඩක් හෝ සේවයක් හෝ ස සඳහා කිසිම වියදමකට හෝ ඕ ඇතුලත් නොවිය යුතු අතර ෙ බැරකම් සහ වැය වර්ෂය සඳහ තිබූ ප්‍රතිපාදන නොඉක්මවිය ් එහෙත් එක් වැය විෂයයක ද ඉක්මවා රු,82,000 ක බැර එළඹ තිබුණි. | මෙම බැරකම කාර්ය මණ්ඩල පුහුණුකිරීමේ ලෙස ඇස්තමේන්තු කර ඇති එහෙත් ෙ නොගෙවූ වියදමකි. | මුදල් රෙගුලාසි 94 (I) ප්‍රකාරව කල යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------ | ---------------------------------- | ----------- |
| 2014 ජුලි ආරම්භ කර වර්ෂ 04 කින් අවසන් කිරීමට කල රු.මිලියන 185 ක් වටිනා නීති ප්‍රඥප්ති ඒකාබද්ධ ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතියේ කාලය 2018 දිනැති අංක අමප/18/0427/731/008 දරන අමාත්‍ය තීරණය අනුව 2020 දෙසැම්බර් 30 දක්වා පමණක් දී තිබුණි. ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා සුදුසු නිලධාරී විට පත් කලද 2021 පෙබරවාරි වන විටත් ව්‍යාපෘ කිරීමට අපොහොසත් වී තිබුණි. | මෙම ඡේදයේ සඳහන් කරුණු සම වේ. | සැලසුම්ගත ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ගැනීමට කටයුතු කළ යුතු |

## 3.2 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඡායා පිටපත් යන්ත්‍රයක්, UPS 18 ක් හා පරිගනෑ මිලදී ගැනීම සඳහා 2020 දෙසැම්බර් 30 රු.2,189 වටිනා චෙක්පත් වෙන් කර තිබුණු අතර එදිනට භෞතික වශයෙන් ලැබී නොතිබුණද බඩු ව පොතට ඇතුළත් කර තිබුණි. ඡායා පිටපත් යන්ත්‍ර පෙබරවාරි 01 දින ලැබී තිබුණු අතර UPS ඩෙක්ස්ටොප් පරිගණක 10, 2021 මාර්තු වෑ දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි. | ඡායා පිටපත් යන්ත්‍රය, UPS 18, ඩෙස්ක්ටොප් පරිගණක 10 දෙපාර්තමේන්තුව වෙත ලැබීම ප්‍රමාද වූයේ, රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ආනයන සීමා කර තිබීමත්, වරාය සේවකයින් පවත්වා ගෙන ගිය අඛණ්ඩ වැඩ වර්ජනයත්, කොරෝනා වසංගතය පැතිර යාම හේතුවෙන් වරායෙන් භාණ්ඩ නිෂ්කාශණ කටයුතු ඇන හිටීමත්, ජෝන් කීල්ස් ආයතනයේ සේවකයින් කිහිපදෙනෙකුට කොරෝනා වැළඳීම හේතුවෙන් එම ආයතනය දින කිහිපයකට වසා තැබීමත් හේතුවෙනි. මාර්තු මාසය අවසන් විමට පෙර සියලුම භාණ්ඩ මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර ඉන්පසුව අදාල ආයතන වෙත චෙක්පත් භාරදීම සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල භාණ්ඩය නිසි ගබඩාවට ලැබීමෙන් ඒ බඩු වට්ටෝරු පොතට කර අදාල ගෙවීම් ( මඟින් සිදුකල යුතුවේ. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සිදු වාහන අනතුරු 37 ක් සම්බන්ධයෙඃ රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කට නොතිබුණි. | එකඟ වෙමි.<br>නමුත් 2020 වර්ෂයේ සිට සිදුවන රිය අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (03) සහ 104(4) ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙන අතර, මේ වන විට ඒ සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලබයි. | වාහන අනතුරු අලාභ හානි සම්බන්ධ රෙගුලාසි 104 (3) හා 104 (4) කටයුතු කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1.1 අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක 148 ක් වුවද ජ්‍යෙෂ්ඨ මට්ටමේ 16 ක්, මට්ටමේ 17 ක්, ද්විතීයික මට්ටමේ 1 ප්‍රාථමික මට්ටමේ 03 ක් වශයෙන් නිලධ හා සේවකයින් 51 කගේ පුරප්පාඩු පැවතුණ | 2020 දෙසැම්බර් 31 දිනට සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි පුරප්පාඩු 6ක් පවතියි. එම පුරප්පාඩු පිරවීමට පෙර බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතින අතර මේ වනවිට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අදාල බඳවා ගැනීමේ පටිපාටිය හැකි ඉක්මණින් සංශෝධනය කර එම තනතුරු සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති තනතුරු ඇතුළු සියළු පුරප්පාඩු සඳහා අවශ්‍යතාවයන් අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කළමනාකරණ සේවා නිලධාරි, පරිවර්තක, හා පරිපාලන නිලධාරී පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් නොගෙන කොන්ත්‍රාත් පදනමින් ; සම්පූර්ණ කර තිබුණි. | පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී පිළිබඳව 2014.11.28 දින සිට අවස්ථා ගණ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනු ඇති අතර 2020.02.05 දින සිට වසරක සඳහා නිලධාරිනියක් කොන්ත්‍රාත් පදනම කර ඇත. එම නිලධාරිනියගේ කොන්ත්‍රාත් දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවති අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 202 දිනැති ලිපිය මඟින් අවසන් වරට මෙම පු පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ දැනුවත් කර ඇත. කළමනාකරණ සේවා පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා අවස අධිකරණ අමාත්‍යාංශයේ MOJ/E08/LDD/1 හා 2020.08.25 දිනැති ලිපිය මඟින් ලේක සේවා, පළාත් සභා හා පළාත් පාලන අමා වෙතින් ඉල්ලා ඇති අතර නැවතත් 202 දිනැති ලිපිය මඟින් ලේකම්, අ අමාත්‍යාංශය වෙත මේ සම්බන්ධයෙන් දන භාෂා පරිවර්තක පුරප්පාඩු සම්පූර්ණ කිරී නිලධාරීන් බඳවා ගැනීමට පෙර ඊට අදා ගැනීමේ පටිපාටිය සංශෝධනය කළ යුතු වන විට ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු පවතී. | හැකිතාක් ස්ථිර පදනමි පුරප්පාඩු සම්පූර්ණ කරවා කටයුතු කළ යුතු වීම. |

4.1.2 **මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | රාජ්‍ය අංශය තුළ මානව සමපත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම ආයතනය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මෙ වන විට සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |